05 වන පිටෙන්

කරලා තියෙන නිසා කැමති වුණා. ඉන්ටව්ව් එකට ගියාම අහපු ප්‍රශ්න වලින් සීයට සීයක්ම නිවැරදිව උත්තර දෙන්න මට පුළුවන් වුණා. ඒ කියන්නේ ඒ ගොල්ලො ප්‍රශ්න දහයක් ඇහුවහම මම විස්සකට උත්තර දුන්නා.

**සන්නසඃ** ඒ කියන්නේ අහපු ප්‍රශ්න කිසිවකට කිසිම පැකිළීමකින් පැටලීමකින් චකිතයකින් අවිශ්වාසයකින් තොරව ඔබට පිළිතුරු දෙන්න පුලුවන් වුණා.

**සේනාධිපති මහතා :** ඔව් ඒ විතරක් නෙවෙයි ඒගොල්ලො අහන ප්‍රශ්න වලට දෙන්න ඕන උත්තරයට වඩා පුළුල් පරාසයකින් පැහැදිලි කරන්න මට පුළුවන් වුණා. උදාහරණයක් කියනවා නම් තේම්ස් නදිය පටන් ගන්නේ කොහෙන්ද කියලා මගෙන් ඇහුවා නම් ඒකෙ දිග පළල පටන් ගත්ත තැන ඉවරවෙන තැන මිනිස්සු කොහොමද ඒ ගඟ ප්‍රයෝජනයට ගන්නේ ආදී සියලුම විස්තර මම දැනගෙන හිටියා. ඔය විදිහට මගේ තිබ්බ්ච සාමාන්‍ය දැනීම පිළිබඳව ඒගොල්ලො පුදුම වුණා. ඉතින් ලකුණු සියයෙන් සීයක් සහිතව තෝරාගත්තා. ලැබිච්ච ලකුණු ප්‍රමාණය නිසා කෙලින්ම මාව පකිස්ථානයට යැව්වා අවුරුදු එකහමාරක පුහුණුවකට. මේක මම ලබපු ලොකුම භාග්‍යයක්.අපි හිටියේ පොලිස් නිල නිවාස වල. ඒකෙ කෙනෙක් හමුදාවට යනවා කියන එක විශේෂ දෙයක්. පොලිස් නිල නිවාස වලින් හමුදාවට ගියපු තුන්වෙනියා මම. ඉසිපතන විද්‍යාලයෙනුත් හමුදාවට ගිය තුන්වෙනියා මම.

මම පනාගොඩ හමුදා කදවුරේ මුල්ම දවසේ සැතපුම් 9 දුවන්න ගියපු වෙලාවේ ඇදගෙන වැටුණා . මොකද මට පොඩි කාලේ ඇදුම තිබුණා. ඒ නිසා මෙය දරා ගැනීමට අපහසු වන්නට ඇති. ඊට පස්සේ මාව හොස්පිටල් ඇඩ්මිට් කරලා ඩොක්ටර්ස්ලා ඇවිල්ලා පරීක්ෂා කරලා බලල කිව්වා ඔයාව ඩිස්කොලිෆයිඩ් කරන්න වෙනවා කියලා.එතකොට මම කිව්වා මාව ඩිස්කොලිෆයිඩ් වෙලා මට ගෙදර යන්න නම් බෑ ,මම මේ තට්ටුවෙන් බිමට පැනලා මැරෙනවා කියලා. එතකොට ඒ අය කිව්වා නෑ නෑ එහෙම වෙන්න උවමනාවක් නෑ අපි ඔයාට තව චාන්ස් එකක් දෙන්නං කියල.

ඊට පස්සේ මම ගියා කොතලාවල ආරක්ෂක පීඨයට හෙමින් මගේ පුහුණු වීම් කටයුතු කරන්න. එතකොට උදේ වරුවේ අනිත් අය පුහුණුවීම් කටයුතු කරල ඉවර උනාම හවස් වරුවේ මම වැලි එකකුත් දාගෙන පිට්ටනිය වටේ දුවන්න පුරුදු වුණා. ඉතින් මුල් දවසේ රවුම් දෙක දෙවන දවසේ රවුම් 4 ඔය විදිහට පුරුදු වෙලා මට රවුම් හැටක් දුවන්න පුළුවන් වුණා. රවුම් හැටක් කියන්නේ කිලෝමීටර් පහළොවක් විතර. ඊට පස්සේ සැතපුම් නමය දුවන්න තිබුන තරගයක්. ඒ තරගයෙන් මම පළමුවැනියා වුනේ දෙවෙනියට වඩා සැතපුම් දෙකක පරතරයක් තියල. මං තේරුම් ගත්තා මිනිසුන්ගේ උවමනාව තියෙනවා නම් අධිෂ්ඨානය තියෙනවා නම් මනස තියනවනං ඕනෑම දෙයක් කරන්න පුළුවන් කියලා. පස්සේ මං හමුදාවට බැඳිලා පාකිස්තානයට ගිහිල්ලා මට ලැබුණා උපදේශක තනතුරක්. හැට දෙනෙක් හිටපු කණ්ඩායමෙන් ඒක ලැබුණේ ගුවන් හමුදාවේ කෙනෙකුටයි යුද හමුදාවේ මටයි ඉඳුනිල් රණසිංහ කියලා කෙනෙකුටයි විතරයි. මම බාධාවන් ජය ගැනීමේ අංශයෙන් හොඳම පුද්ගලයා වුණා. මේ අනුව මට හමුදාවේ පසුපස ඉදන් යුද්ද කරන ඕනෑම අංශයකට යන්න සුදුසු කම තිබුණා. මගේ යාලුවගෙ තාත්තට වූ සිදුවීම නිසයි මම හමුදාවට බැඳුනේ. ඒ නිසා මට යන්න ඕන වුණේ හමුදාවේ විශිෂ්ටතම ඒකකයට. ඒ අනුව මම ඉල්ලා හිටියා මාව දාන්න කියලා කොමාන්ඩෝ රෙජිමේන්තුවට.

හමුදාවේ හිටිය මට ඉතා ආදරයෙන් සලකපු පකිස්තානු ජෙනරාල් කෙනෙක් සඟරොල්ලා කියලා .එතුමා මට කිව්වා මේ යුද්දේ වෙලාවෙ කොමාන්ඩෝ එකට යන එක මහ මෝඩ කමක්, ඇයි ඔබ මේ වගේ තැනකට යන්න උත්සාහ කරන්නේ කියලා. මම කිව්වා මම හමුදාවට බැඳිල පලවෙනි මෝඩකම කළා වගේම දෙවන මෝඩකමත් කරන්න ලෑස්තියි කියල. එතකොට එයා හිනා වෙලා මට ඊට අවකාශ ලබා දුන්න.කොමන්ඩො එකට යනවා කියලා කියන්නේ යුද්ධයේ බිහිසුණු අත්දැකීම් වලට මුහුණ දෙන්න වෙනව කියන එක. ඒ වෙලාවේ කොමාන්ඩෝ එකට බඳවා ගත්තෙ වෙනත් රෙජිමේන්තු වලින්. කොමාන්ඩෝ එකට බැඳුනු 21 දෙනෙක් හිටිය. ඔතනින් මම විතරයි පලවෙනි සැරේට පාස් වුනේ.එක වතාවක් ෆේල් වෙලා ආපු එක්කෙනෙකුත් පාස් වුනා.අවුරුදු එක හමාරක් පුහුණු වෙලා ලුතිනන් කෙනෙක් හැටිය තමයි මම එලියට ආවේ. ඊටපස්සේ තමයි මන් යුද්දෙට ඇරියේ.

හමුදාවේ තිබ්බ්ච හොඳම අංශයක් තමයි ප්‍රතිත්‍රස්ත ඒකකය. මම එතෙන්ට තමා ගියේ. කමාන්ඩෝ රෙජිමේන්තුවේ ප්‍රධානම රාජකාරී මට පැවරුණා. එහිදී මම දක්ෂතා පෙන්නලා පළවෙනියා වුණා දෙවෙනියා උනේ මහින්ද රාජපක්ෂ කියන නිලධාරියා. එයා අගමැති මහින්ද නොවෙයි. වෙනත් කෙනෙක්. පසුව මම යැව්වා බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපොළේ ප්‍රතිත්‍රස්තවාදී කණ්ඩායම් නායකයා හැටියට. එතන කේටරින් එකේ මාස පහක් ඉගෙන ගත්තා කොහොමද කේටරින් කරන්නේ කියලා. ඒව කළේ වෙස් වලාගෙන. අවුරුදු එකහමාරක් එතන හිටිය කාලේ ඉන්දියන් සාම සාධක හමුදාව ආවා. එකේ ප්‍රධානියාට සෑහෙන තර්ජන තිබුණා එල් ටී ටී ඊ එකෙන්. මම ප්‍රතිත්‍රස්ත කණ්ඩායමේ ප්‍රධානියා හින්දා මට බාර දුන්නා ඔහුගේ ප්‍රධාන ආරක්ෂක නිලධාරියා හැටියට කටයුතු කිරීමට. එයා ආවාම මාස ගණනක් ඉන්නවා. එයා අන්තිමට යනකම්ම මම තමා ඔහුගේ ප්‍රධාන ආරක්ෂක නිලධාරියා. එයා මට කොච්චර ආදරේද කියනවනම් එයා හෙලිකොප්ටරෙන් බැහැපු ගමන් මට සැලියුට් කරනවා. එයාට පහර දෙන්න ආපු මරාගෙන මැරෙන ත්‍රස්තවාදියෙක් අපට අත්අඩංගුවට ගන්න පුළුවන් වුණා. එතනින් එයා දැන ගත්තා අපේ දක්ෂ කම. අපි සිවිල් පිට ඉන්න ගමන් තමයි මෙහෙයුම ක්‍රියාත්මක කළේ. ඒ නිසා ඔහු ලංකාවට ආපු හැම වෙලාවකම මාව තමා එයාගෙ ආරක්ෂාව සඳහා තෝරා ගත්තෙ. මේ නිසා මට ඉහළ පෙළේ අයත් සමග තමයි ගැවසෙන්නට වුනේ. ඊට පස්සේ ඩී බී විජේතුංග මහත්මය ජනාධිපති තනතුරට පත් වුනාම මාව ගෙනල්ලා ඇහුවා එයාගේ ආරක්ෂාව බාර ගන්න පුළුවන්ද කියලා. එතකොට ඔහුගේ ආරක්ෂාවට හිටිය හත් සීයක විතර කණ්ඩායමක්.එතුමා මගෙන් ඇහුව කීදෙනෙක් ඔයාට ඕනද කියලා. මම කිව්වා මට විස්සක් ඕනි කියලා. අපේ නිලධාරියෙක්, සොල්දාදුවෙක් කියන්නේ විශේෂ පුද්ගලයෙක්. කමාන්ඩෝ නිලධාරියෙක් යුද හමුදාවේ සීයකට සමානයි. පසුව මම යැව්වා පලවෙනි වතාවට යුධ හමුදා විද්‍යා පීඨයේ විශේෂ පාඨමාලා නිලධාරී හැටියට. එහිදී මට මුලින්ම පැවරුණේ මාස හයක් පුහුණු වෙච්ච කණ්ඩායමක් සමත් කිරීම . මං ඒ අය පරීක්ෂා කරලා කිව්වා, මේ අය ඔක්කොම අසමත්, මටනම් මේ අය පාස් කරන්න බෑ කියලා. මේ අය යුද්ධයට යැව්වොත් අනිවාර්යෙන්ම මැරුම් කනවා,ඒනිසා තව අවුරුද්දක් පුහුණු කරන්න ඕන කියලා. එතන හිටපු කමාන්ඩර් කිව්වා එහෙම කරන්න බෑ කියලා. මං කිව්වා එහෙනං වෙන කෙනෙක් දාගන්න මටනම් මේ වැඩේ කරන්න බෑ කියලා.මොකද දැන දැනම එයාලගේ මරණ වරෙන්තුවට අත්සන් කරන්න මට බෑ .ඒ සැරේ මගේ ඉල්ලීමට ඒ අය තවත් මාස හයක් පුරුදු කරන්න අනුමැතිය ලැබුණා . මම එහෙම පුරුදු කළ නිලධාරීන් හිටපු ජනාධිපති චන්ද්‍රිකා කුමාරතුංග මැතිණියගේ එතකොට වර්තමාන අගමැතිතුමාගේ පෞද්ගලික ශරීර ආරක්ෂකයින් හැටියට සේවය කරනවා. ඉරිදා සෙනසුරාදා මම කඳවුරට ගිහිල්ලා වැඩ කළා. මොකද මං වෙනුවෙන් වෙනත් නිලධාරීන් යුද භූමියේ සිටින නිසාත් පන්නිපිටියේ මගේ ගෙදරට කඳවුර ළඟ නිසාත්. මම මෙහෙම ඉරිදා සෙනසුරාදා සිවිල් පිටින් වැඩ කරනවා ජෙනරාල් සිරි පීරිස් දැක්කා.මං එයාට විස්තර කිව්වා.ජෙනරාල් සිරි පීරිස් කියන්නේ බොහොම නිර්භය නිලධාරියෙක්. තිම්පු සාකච්ඡා වලට එහෙම ගියෙත් එයා. එයා මට ගොඩක් ආදරෙයි. මෙයාට යුද්දේ තියෙන ප්‍රදේශවලට යන්න උවමනා වුණා. ඒ උනාට එයත් එක්ක හිටපු නිලධාරීන් හතර දෙනාම කිවුවා බෑ කියලා, මොකද යුත්තේ ඉතාම බිහිසුණු විදිහට කෙරීගෙන ගියපු නිසා. එතුමට යුද්දේ තියෙන ප්‍රදේශවලට යන්න කවුරුත් නැති නිසා මම ඇහුවා මට සර් එක්ක එන්න තරම් සුදුසුකම් නැහැ, මම කර්නල් විතරයි, ඒත් සර් තනියම යන නිසා මම එන්න කැමතියි අනුමැතිය දෙනවද කියලා.මේ ගැන එතුමා ගොඩක් සන්තෝස වුණා. එවෙලෙම මාත් එක්ක අපේ ගෙදරට ගිහිල්ලා අවශ්‍ය බඩු මුට්ටු ටිකත් අරගෙන අපි කෙළින්ම ගියේ අලවෙඩ්ඩි මෙහෙයුමට.ඒක ආමි හෙඩක්වාටර්ස් එක දන්නෙත් නෑ .එහෙ තිබුණු තත්ත්වය උඩ අපිට කෝකියෙක් වත් හොයාගන්න නෑ. මම තමයිකෝකි වැඩ කළේ. සතියකට පස්සෙ තමයි හමුදාව දන්නෙ මං එහෙ ඉන්නවා කියලා. ඒ වගේ මම යුද්ධ කාලේ දරුණුම අවස්ථාවන්ට මුහුණ දීලා තියෙනවා. කට්ටපරිච්චාන්, මාන්කුලම්, ආදියේදී ඉතා දරුණු ලෙස සටන් කරලා බේරෙනු නිලධාරියෙක් තමයි මම.

**සන්නසඃ** ඔබ අති දක්ෂ හමුදා නිලධාරියෙක් ලෙස සේවය කරලා ඉන් ඉවත් වුණේ ඇයි.

**සේනාධිපති මහතා**. එක්තරා අවස්ථාවකදී කිව්වා අපිට ආයුධ භාර දෙන්න කියලා ඒකෙන් මං ගොඩක් කලකිරුණා .අපේ සොල්දාදුවො නිලධාරීන් ජීවිත පරිත්‍යාග කරමින් කොටසින් කොටස ජයග්‍රහණය කරගෙන එන කොට යුද්දෙ නවත්තල ආයුධ භාර දෙන්න නං මං හිතුවා මොකටද මම යුද්ධ කරන්නේ කියලා. මේ නිසා මට ගොඩක් බලපෑම් ආවා. ජෙනරාල් දයා රත්නායක කියයි මේ ගැන. මට මේ සම්බන්ධව හමුදාවේ ඉහළ නිලධාරීන් එක්ක වාද කරන්න සිද්ධ වුණා. ඊට පස්සේ මාව කොළඹට එව්ව. ඒ සැරේ මං හමුදාවෙන් අස්වෙන්න අවසර ඉල්ලුවා. ඒ කාලේ ජෙනරාල් හිටියේ දළුවත්ත. එයත් මට ගොඩක් ආදරෙයි. එයා වහාම මාව ප්‍රධාන ආරක්ෂක නිලධාරී කළා. ඒක කර්නල් කෙනෙකුගේ රැකියාවක්. මම කිව්වා මං වැඩ කරන්නේ ඔබතුමාගේ යටතේ විතරයි කිසිම කෙනෙක් මට අණ දෙන්න බෑ කියල.එයා මට කමාන්ඩර් ඔෆ් ද ආමි කියලා අත්සන් කරලා දුන්නා. ඒ කාලේ මං කිසිම ප්‍රහාරයක් වෙන්න දුන්නේ නෑ.ඔය තමයි මගේ හමුදාවේ පසුබිම.

**සන්නසඃ** ඔබ ඉතා ඉහල මතකයක් තියෙන කෙනෙක්. ලිපිගොනු සියයක් අතරින් ඒ ලිපි ගොනුවේ ඇති දේවල් ඉතා පැහැදිලිව හා නිවැරදිව ඔබට කියන්න පුළුවන්. මේ හැකියාව ජන්මයෙන් ලැබුණු දෙයක්ද?

**සේනාධිපති මහතාඃ** මම ධර්මය අනුව ජීවත් වන කෙනෙක් බුදුන් වහන්සේ වදාරා තියෙනවා එළඹ සිටි සිහියෙන් වැඩ කටයුතු කරන්න කියලා. අපි සම්මා සතිය ඒ කියන්නේ හොඳ සිහියෙන් කටයුතු කරන්නවනම් අපගේ සියලු වැඩ පහසු වෙනවා. යම්කිසි දෙයක් යම්කිසි තැනක තබනවා නම් එය එතන තැබූ බව සිහියට නගාගෙන කළ යුතුයි. නොඑසේ නම් පසුව එය සොයන්නට ගියාම අපි විශාල වශයෙන් කාලය අපතේ යවනවා. සම්මා සතිය කියන දේවල් කමාන්ඩෝ රෙජිමේන්තුවේ දී අපිට පුහුණු කළා. මෙය ජන්මයෙන් ආවට වඩා අපි මහන්සි වෙලා පුහුණුවෙන් ලබා ගත්තා කියලයි මට හිතෙන්නේ.

හැමදේම සිහිකල්පනාවෙන් යුක්තව කරනවනම් අහනවනම් කියනවා නම් ඒවා ආයෙත් අමතක වෙන්නේ නෑ .මම අවුරුදු විසි ගණනක් තිස්සේ දවසකට පැය හතරක් පොත්පත් කියවනවා. නොයෙකුත් භාෂාවල පොත්පත්වලින් ක්‍රිකට්, ෆුට් බෝල්, දේශපාලනය ,මිසයිල ගැන, පාසල් ළමුන්ගේ දක්ෂයන් ගැන, ලෝක ආර්ථිකය, ලෝක ත්‍රස්තවාදය, ලෝක කාර්මීකරණය, කොරෝනා වෛරස් ගැන ආදී නොයෙකුත් ක්ෂේත්‍ර වලට සම්බන්ධ දේවල් ගැන දැනගන්නවා පමණක් නොවෙයි මම මතක තබාගන්නේ කියවන දේවල් යහපත් සිහියකින් යුතුව හොඳ සිහියකින් යුතුව කරන නිසයි.

**සන්නසඃ** බොහොමයක් ලංකාවේ ව්‍යාපාර වල සේවක සේව්‍ය දෙපාර්ශවය අතර ඝට්ඨන තමයි දකින්න ලැබෙන්නේ. නමුත් ඔබේ ව්‍යාපාරයේ සේවක සේව්‍ය දෙපාර්ශවය අතර ලොකු බැඳීමක් තියෙනවා. මේක ඇති කළේ කොහොමද?

**සේනාධිපති මහතාඃ** ඒකත් කොමාන්ඩෝ එකෙන් පුහුණු වුනු දෙයක්, මොකද යුද හමුදාවේ නිලධාරියා හා සොල්දාදුවා අතර බොහොම පරතරයක් තියෙනවා. නමුත් කමන්ඩෝ එකේදි මම යුද්දෙට යන්නේ මගේ සෙසු නිලයන් එක්ක, බොහෝවිට සොල්දාදුවන් අටක්, හතරක් වගේ වෙනවා ඔවුන් යුද භූමියේදී මට වඩා මනා පරිචයක් ලබා ගත්ත අය විය හැකියි. කමාන්ඩෝ එකේ සිංහල කියමනක් තියෙනවා යුධ භූමියේදී මගේ මුත්‍රා වල සුවඳ ඔහුත් ඔහුගේ මුත්‍රා වල සුවඳ මමත් දැන ගත යුතුයි කියලා. ඔහුගේ සිතුම් පැතුම් මා දැනගත යුතුයි, මගේ සිතුම් පැතුම් ඔහු දැනගත යුතුයි කියලා. මොකද මට වෙඩි වැදුනොත් ඔහු කිසිවිටෙකත් මගේ ශරීරය එතන දමා යන්නේ වත් ඔහුට වෙඩි වැදුණොත් ඔහුගේ ශරීරය මා එතන දමා එන්නේවත් නැහැ .ඒ සබඳකම රෙජිමේන්තුවෙන් ඇතිකල දෙයක්. යුද්දෙට ගියාම නිලධාරියා තනියෙන් තීරණ ගන්නෙ නැහැ .කළ යුතු දෙය නොකළ යුතු දෙය පිලිබඳ තීරණ ගන්නේ තම කණ්ඩායමත් එක්ක සාකච්ඡා කිරීමෙන් පසුව. සමහර විට මම කියන දේට ඒගොල්ලෝ කැමති වෙන්නෙ නෑ, ඒ ගොල්ලන්ගේ අදහස් ඒගොල්ලෝ කියනවා සමහරවිට මගේ අදහස් වලට වඩා ඒ අයගේ අදහස් ඉතා හොඳ වෙන්න පුළුවන්. එහෙම තමයි කමාන්ඩෝ එකේ හැටි. අපිට තියෙන්නෙ ටීම් වර්ක් එකක් .අපේ ආයතනයේ සේවකයෙක්, නායකයෙක් යටතේ වැඩ කරන්නේ නෑ. සෑම කෙනෙකුටම අපේ ආයතනයේ රාජකාරියක් තියෙනවා. මටත් තියෙනවා. අපි ඔක්කොම ආයතනයට වැඩ කරනවා. ස්වාමියා තමයි ආයතනය.ස්වාමියා මම නෙවෙයි. මමත් සේවකයෙක් විතරයි. ආයතනය මගේ නෙමෙයි අපේ. අනික මම පසුගිය අවුරුදු පහළොවක් තිස්සෙම

20 වන පිටට